

# වෙල්ලස්සේ
# බින්තැන්න
# බිබිල.

S.M.ඉසුරි උමේදා සිටිසේකර.

(කර්තෘ)

# කෘතියේ නම

# වෙල්ලස්සේ බින්තැන්න

# බිබිල

ISBN 978- 624-206-754-4

## කර්තෘ

එස්.එම්.ඉසුරි උමේදා සිටිසේකර.

මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර.

## කෘතිය එළිදක්වන දිනය

2023 - 11 – 15

## චිත්‍ර සහ ඡායාරූප

එස්.එම්.ඉසුරි උමේදා සිටිසේකර.

## අනෙකුත් ඡායාරූප

අන්තර්ජාලය සතුයි.

# පිදුම.

පවුරක්සේ මා ආරක්ෂා කරන

අම්මාටත්, අප්පච්චිටත්

මා මෙන්ම මාගේ

සහෝදර සිසුවියන්

සියළුම දෙනාට දෙවැනි අම්මාවූ

චාමිණී පල්ලියගුරු

ගුරු මව්තුමියටත් ආදරයෙන්

පුදකරමි.

# පෙරවදන.

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවන්වෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසල් දර්ශණයට අනුව යමින් අපගේ මහපෙන්වීම යටගේ ලේඛනකරණය සහඡයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්තකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිතය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ගේ අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතටය එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහොදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිතය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන් මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනය මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසවල් කලමනාකරණ මණ්ඩලය ගුරුහවතුන් දෙමාපියන් ආදි ශිෂයාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුහවතුන් මෙන්ම නන්අයුරින් උදවු උපකාර කළ සැමට හෘද්‍යාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙවනවිරත්න මහලේකම්ගේද සේවය අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහමායා බාලිකා විද්‍යාලය -මහනුවර

2023.10.20



අම්මයි, අප්පච්චි කියන විදියට අතීතයේ වෙල් ලක්ෂයක් තිබුණ නිසා වෙල්ලස්ස කියන නම මේ පාළාතට ලැබුණලු.

නිසලව ගලායන ගල්ඔයට මායින්ව පිහිටි සුන්දර වෙල්ලස්සේ බින්තැන්නේ නගරයක් තමයි බිබිල කියන්නේ.




ගොඩාක් උස කඳු පන්තිවලින් හා කුඹුරු යායවල් වලින් වටවුණු බිබිල නගරය ඉතා මනස්කාන්ත දර්ශනයක් මවාපායි.



ගස් වැල් දිය දහරාවන් හා සතා සිවුපාවන්ගෙන් පිරුණු ගම්මානයන් උදෑසනට හා සවස් කාලයට ඉතා අලංකාරව පෙනෙයි.

ස්භාවිකවම පොළොවෙන් මතුවන දිය බුබුල් රාශියක් ඇති නිසා පැරණි මුතුන් මිත්තන් බිබිල යන නම දැම්මා කියලා අත්තම්මා මට කියා දීලා තියෙනවා.




දැනටත් ගම්මානයේ සැරිසරන ඕනෑම අයෙකුට පිරිසිදු ජලයෙන් පිරුණු මෙම දිය බුබුළු දැක ගැනිමට පුළුවනි.

බිබිල නගරය හා බැඳුණු ජනකතා රාශියක් තිබුණත් ඉන් අත්තම්මා අපට කියා දුන්න ඉතා රසවත් අතීත කතා වලින් ටිකක් පුංචි ඔයාලටත් දැනගන්න මම ඉන් බිඳක් මේ පොත් පිංචට ඇතුලත් කරන්නම්.

මගේ ගමේ තියෙනවා කොටසර පියන්ගල රජමහා විහාරස්ථානය කියලා අනුරාධපුරය යුගයට අයත් ඉතා පැරණි පන්සලක්.

පොලොන්නරු යුගයේදී මෙම පන්සල් භූමියේදී විශේෂ සිද්ධියක් සිදුවී තිබෙනවා.

දන්ත ධාතූන් වහන්සේත් , පාත්‍ර ධාතූන් වහන්සේලාගේත් ආරක්ෂාව සඳහාත් සුගලා දේවිය විසින් මේ ධාතූන් වහන්සේලා මේ පන්සලේ විශේෂ ආරක්ෂිත කුඩා කුටියක ආරක්ෂාව සඳහා තැම්පත් කළාලු .



රජ කාලයේ සිට මේ දක්වා පැරණි පොත පතේ සඳහන් කතා රාශියක් පන්සලේ නායක හාමුදුරුවන්ගෙන් අපි අසා දැන ගන්නේ ඉතා අසාවෙනි.

අපි පන්සලට ගියාම මේ කුඩා කුටිය බලන්න යනවා. එක ඇතුලේ පැරණි චිත්‍ර ගොඩාක් දකින්න තියෙනවා. පන්සල හතර වටේම ගල් කණු දකින්නත් පුළුවන්.



අවුරුදු ගණනාවක් මෙම පන්සලේ වැඩ සිටි දන්ත ධාතූන් වහන්සේ පසු කාලෙක මහනුවර දළදා මාලිගාව වෙත පෙරහැරකින් වැඩම කරවලා තියෙනවා කියලා මම අහලා තියෙනවා.

අදටත් දළදා මාලිගාවේ වගේම කොටසර පියන්ගල රජමහ විහාරයේත් දින ගණනාවක්ම ඉතා අලංකාර පෙරහැර පවත්වනවා .

පෙරහැර කාලයට නම් කුඩා අපි කවුරුත් හරිම කැමති. පන්සලට යන අපි බුදුන් වැඳලා පන්සල් මළුවේ ඇවිදිනවා .

පාට පාට බල්බ වලින් එළිය වැටුණු පන්සල හරිම ලස්සනයි. ඒ වගේම පෙරහැරට අරගෙන ආපු අලි ඇතුන්ට කෑම දෙන්නත් අපි අමතක කරන්නේ නෑ.



අම්මගෙයි, අප්පච්චිගෙයි අතේ එල්ලිලා කඩවල් පේලි දිගේ ඇවිදලා පැණි රස කෑම ජාති කන්නත්, ලස්සන ලස්සන සෙල්ලම් බඩු බඩු තෝරන්නත් ඒවා මිළදී ගන්නත් මම නම් හරිම ආසයි.

යුගයේ මිනිසා නමින් හඳුන්වන “මහාචාර්ය සේනක බිබිලේ” මහතා බිහි වන්නේද මෙම ප්‍රදේශයෙනි.

අත්තම්මා කියලා දීලා තියෙන විදියට "හිටිහාමි මුදියන්සේ" රටේ රාල කියන ඡාතික විරයා කැලයේ හැංගිලා ඉදලා සුදු ජාතික නායකයෙකුට හීයකින් විදලා මැරුවලු.



මෙම ස්මාරක අනාගතයේ සියලු දෙනාට දැකබලා ගැනිමට අදාල නිලධාරින් සංරක්ෂණ කටයුතු කර තිබීමද අගය කලයුතු කරුණකි.

වෙල්ලස්සේ කැරැල්ල අවසන් වෙන්නෙත් මේ ගම්මානයෙන් වීම තවත් එක් විශේෂයකි.



( උපුටා ගැනීම අන්තර්ජාලය සතුයි)

අත්තම්මා මේ කතා කියන්නේ හරි ආඩම්බරයෙන්. අත්තම්මා කියන විදියට අත්තම්මගේ පරම්පරාවත් අතීත කතා වලට සම්බන්ධකම් තියෙනවලු.

අතීතයේ අපේ රට ඉංග්‍රීසි ජාතිකයන්ගෙන් බේරාගන්න ඉදිරිපත් වුණ නායකයින් හා වර්තමානයේ දී රටට වැඩදායි නායකයන් බිහිවීම පිළිබඳ අත්තම්මා කියන කතා අහගෙන ඉන්න මටත් ආඩම්බරයක් දැනෙනවා.





එවැනි අභිමානවත් සුන්දර මිනිසුන් ජීවත් වුණු පරිසරයක ඉපදීම මා ලද භාග්‍යයක් නිසා.

තවද, බිබිල නගරයට යාබදව මහියංගන පූදබිමත්, මූතියංගන රජමහා විහාරයත් , කඳ සුරිඳුගේ අඩවියත්, යාල වන උද්‍යානයත් පිහිටලා තියෙනවා.

ශ්‍රී ලංකාවේ දොඩම් වලට ප්‍රසිද්ධ නගරය බිබිල කියල දැනටමත් ඔයාලා දන්නවා ඇති කියලා මං හිතනවා .



ඒ වාගේම මගේ ගමේ තිබෙන ඉඩම්වල ඉතා වටිනා මැණික් වර්ග හමුවෙනවා .



(උපුටා ගැනිම අන්තර්ජාලය සතුයි)

ඒවා පොලවෙන් උඩට ගැනිමට හාරන ස්ථානය පතලක් කියලා කියනවා. ඒවායින් ඉතා වටිනා මැණික් වර්ග හමුවෙනවා .



(උපුටා ගැනිම අන්තර්ජාලය සතුයි)

මම ඒවායින් හමුවන පාට පාට මැණික් වර්ග දැකලත් තියෙනවා .

අම්මායි, අයියයි, නංගියි, මමයි දැන් ඉන්නේ නුවර. මෙම පොත් පිංච ලිවිමට මා යොමු කල මගේ පාසල වන මහනුවර මහමායා විදුහලට ටිකක් දුරින් ඇති ගෙදරකයි.

නැදෑයින් කිසි කෙනෙකු පෙන්නවත් නැති, සෙල්ලම් කරන්න යාළුවන් නැති, අළුත් පරිසරයකට හුරුවෙන්න හරිම අමාරුයි .

මගේ ගම වගේ, ගෙදර වගේ නොවුනත් මම දැන් මේ වටපිටාවට පුරුදු වෙන්න ඕන කියලා පුංචි මට තේරෙනවා.

බිබිලේ ඉඳලා මට මහමායාවට එන්න ලැබුණේ මගේ වාසනාවටලු. නැන්දලා, මාමලා අම්මා එක්ක කියනවා මට ඇහිලා තියෙනවා.






මං තවම පොඩි නිසා ඒ ගැන කියන්න මම දන්නේ නෑ.

ඒ වුණාට මම තවමත් ආස ගමේ තියෙන අපේ ගෙදරට විතරමයි.

බුදුරාජාණන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ තැම්පත් කරලා තියෙන්නේ කරඬු හතක් ඇතුලේ කියලා මාලිගාව වඳින්න ගිය දවසක අප්පච්චි මට කියලා දුන්නා.




ඔයාලා දන්නවද මම පාසල් ඇරිලා යනකොට බිබිල කියලා නම තියෙන බස් එකක් වැව රවුමෙන් කුරුල්ලෙක් වගේ වේගෙන් යනවා. ඒ හැම වෙලාවෙම මට ලොකු සතුටක් දැනෙනවා.

ඒ මගේ ගමට යන බස් එක. මටත් යන්න හිතෙනවා මගේ ගෙදර.

දුකකුත් නොදැනුනාම නොවෙයි එත්, අධ්‍යාපනය තමයි ජීවිතේට වටින්නේ කියලා අම්මා නිතරම කියනවා මන්තරයක් වගේ.

අම්මා එහෙම කියන්නෙත් පුංචි මට ගොඩාක් ආදරේ නිසයි.





මා හට නිතර මගේ ගමට යන්න බැරි වුණත්, සිහිනෙන් හෝ මගේ ගමේ අසිරිය විඳින්න අයියා, නංගි, ගමේ යාළුවෝ එක්ක අපේ ගෙදර නිදහසේ සෙල්ලම් කරන්න කුඹුර වටේ රවුමක් යන්න මම තාමත් ආසයි.



සුන්දර පරිසරයක නිදහසේ ගෙවුණ මගේ පුංචි කාලය ඉවරයි කියලා වේලාවකට මට හිතෙනවා .

බලන බලන හැම පැත්තෙම දැන් මට පෙන්නේ විශාල ගොඩනැගිලි, පාරවල් වල වේගෙන් දුවන වාහන, කලබලයෙන් එහෙ මෙහෙ යන මිනිසුන්.





උපුටා ගැනිම අන්තර්ජාලය සතුයි)

මම ඉගෙන ගන්න ආසයි . එත් අකුරු ලියන්න කම්මැලි වුනාම පාසල් වැඩ මග ඇරෙනවා මටත් නොදැනිම .



මම උත්සහා කරනවා අම්මටයි , අප්පච්චිටයි හොඳ දුවෙක් වෙන්න, මම ඉගෙන ගන්න පාසලට හොඳ ශිෂ්‍යාවක් වෙන්න, රටට වැඩදායි පුරවැසියෙක් වෙන්න.

ලස්සනම ලස්සන කතන්දර පොත් ගොඩාරියක් මම කියවලා තියෙනවා. අන්තර්ජාලය හරහාද කතන්දර විශාල ප්‍රමාණයක් බලලා තියෙනවා.

කතා පොතක් ලියන්න අපට පාසලෙන් අවස්ථාවක් ලැබුණම මට හිතුනේ මම ගැන ලියන්න .

"ඔයා ගැන ලියන්න නම් ඔයා ඉපදුන නගරයෙන්ම කතාව පටන් ගන්න ඕන". එතකොටයි කතාව ලස්සන වෙන්නේ.

ඒ තමයි අම්මා මට දුන්න උපදෙස.






ඉතින් මගේ කතාව වෙනස් විදියේ කතාවක් වෙයි කියලා මම හිතනවා.

අතීත රජ සමයේ පටන් ඌව වෙල්ලස්ස හා කන්ද උඩරට රාජධානින් දෙක අතර සිදු වූ ඉතා රසවත් කතා වෙන වෙනම ඔයාලා කියවලා ඇති.

මේ දැන් වර්තමාන කාලයයි.

ඌව වෙල්ලස්සේ බිබිලටත්, කන්ද උඩ රට රාජධානියේ මහනුවරටත් මැදි වූ පුංචි මගේ කතාවයි මේ.
මගේ කථාව කියවන නගරයේ ජීවත්වන ඔයාලටත් ආස ඇති මගේ ගම බලන්න.

ඉතින් ඔයාලත් එන්න ගස්වැල්, ගංගා, ඇළ දොල, කඳු පන්ති, කුඹුරු යායවල් සහ සතා සිවුපාවන්ගෙන් පිරුණු වෙල්ලස්සේ බිබිල නගරයේ නිදහස් සුන්දර අසිරිය විඳින්න.



(බිබිල උණගොල්ල් රජමහා විහාරයේ ඉදිකල ශෛලමය බුදුපිළිම වහන්සේ )

මගේ පොත කියවපු ඔයාලා හැමෝටම

සම්මා සම්බුදු සරණයි..!!

# පසුවදන.



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොට ගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරිම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂන ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩ නැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟිම් දැනිම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හීක්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසාත් ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට අලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු වීමට ශක්තිය ලැබේවායී පතමු.

මෙයට,

සෙනෙවිරත්න මහ ලේකම්

පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකල ව්‍යාපෘතියේ නිර්මාතෘ

**2023.10.20**

**ISBN 978- 624-206-754-4**